යාපනයේ වෛද්‍ය පීඨයේ සිසුවෙකුගේ මරණය සම්බන්ධයෙන් පුවත්පත් කීපයක්ම තොරතුරු පළ කොට තිබෙනු නිරීක්ෂණය කළ හැකි විණි. මෙහිදී දිවයින සහ ලංකාදීප පුවත්පත් මෙම මරණය දිවි අහිමි කරගැනීමක් ලෙසින් වාර්තා කර තිබිණි. කෙසේ වෙතත්, මෙම මරණය පිළිබඳව එම සිසුවාගේ ඥාතීහු සැක පහළ කරනා බැවින්, දිවි අහිමි කරගත් ආකාරය සඳහන් කර තිබීම මහජන බැඳියාවට අදාළ වේ යැයි ගත හැක.

කෙසේ වෙතත්, මෙවැනි පුවත් වාර්තාවක් පවා දිවි අහිමි කරගැනීමක් ලෙසින් දක්වන්නේ නම්, හදිසි උපකාරක අංක ඒ සමගින් සඳහන් කිරීම වඩාත් යෝග්‍ය මාධ්‍යකරණයයි. එම හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතය බේරාගැනීමට ඉඩක් සැලසෙනු ඇත.

හදිසි උපකාරක අංක:

*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Divaina**
See Less